

3 වන පිටෙන්

ගෙදර යැවූ රාජපක්ෂලා වෙනුවෙන් යාග හෝම පවත්වන තැනක් බවට පාර්ලිමේන්තුව පත් කර ගැනීමයි. පාර්ලිමේන්තුවේ විනයද පක්ෂ විනයද සාහසික ලෙස බිඳ දමමින් යකා නැටූ මොවුහු කළේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ගෙන ආ සහ ගෙන එන්නට නියමිත වූ අනපනත්වලට බාල්දි පෙරළීමයි. ඉහතදී මා පක්ෂ විනය යනුවෙන් අදහස් කරන්නේ පක්ෂයේ නායකයා විසින් ප්‍රකාශිත ප්‍රතිපත්තිවලට සහාය දීමයි. එසේ නොමැතිව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මහින්ද රාජපක්ෂ ගෙන ආ ඒක නායක විනය නොවේ.

වංචාවෙන් සහ බලහත්කාරයෙන් නිවසක් දේපළක් අල්ලාගෙන එය සාපරාධීලෙස පරිහරණය කරමින් සහ භුක්ති විඳිමින් සිටි මදවි පිරිසකට එතැනින් ඉවත්ව යන ලෙස අධිකරණ තීන්දුවක් දුන් විට ඒ මදවියන් කරන්නේ ඒ දේපළත් නිවසත් හැකි තරම් විනාශ කර අවසානයේදී නිවසේ හැම තැන මළ පහ කර යෑමයි. මහින්ද රැක ගන්නට සියලු වෙර දරා අසමත්ව ඔහුත් සමඟම පරාජයට පත්වූ ඔහුගේ අන්තේවාසික මන්ත්‍රීවරුන් අද පාර්ලිමේන්තුව තුළ හැසිරෙන්නේ අර කී නිවසෙන් ඉවත්ව යන්නට තීන්දු ලැබූ මදවියන් පරිද්දෙනි. ජනතාව තමන් පරාජයට පත් කළ බව මොවුහු දනිති. දැන් ඔවුහු හතර වට ගඳ ගස්සමින් එහි මළ මුත්‍ර පහකරමින් සිටිති. දැන් ජනතාව විසින් මේ මදවියන් එළියට ඇද දමා නිවස සුද්ධ පවිත්‍ර කර අළුත් වැඩියා කර ගත යුතුව ඇත. ඒ සඳහා ළඟ එන මහා මැතිවරණය යොදා ගන්නට ජනතාව සූදනම් කිරීම ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන කාගේත් වගකීම වන්නේය.

මහා මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කළයුත්තේ කාටද යන තීන්දුව ගැනීමේදී රාජපක්ෂ පවුල් පාලනය ආරක්ෂා කරමින් මහා පරිමාන දූෂණ වංචා සිදු කළ දේශපාලනඥයන් පමණක් නොව මෛත්‍රී ජනාධිපති බවට පත් වූ පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඇතුළු ජනතා හිතවාදී අණපනත්, යෝජනාවලට බාල්දි පෙරළූ සියලු මැති ඇමතීන්වද, තවමත් ජාතිවාදය අවුස්සමින් සිටින්නන් ද පාර්ලිමේන්තුවෙන් දුරුකිරීමට ජනතාව දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වන්නේය. ගතවූ මාස හතරහමාර තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම් සහ එක්සත්

> **ජනාධිපතිවරණය කාලයේ රාජ්‍ය ආයතනයක වියදමින් කෝටි හැටක සිල්රෙදි බෙදීම සම්බන්ධයෙන් අද ඔහු කියන දේ ඔහු රටට හුරුකළ දේශපාලන සදාචාරය කවරේද යන්න පෙන්වන තවත් නිදසුනකි. 'සිල්ගන්න අයට සිල්රෙද්දක් දෙන්නත් බැරිනම් ඒක පුදුම වැඩක් නේ' යයි ඔහු කියයි. ඡන්දයක් ප්‍රකාශයට පත් කළ පසු කිසියම් අපේක්ෂකයකු මහජන මුදලින් පමණක් නොව තම පුද්ගලික ධනයෙන් වුවද ඡන්ද දායකයකුට යම් මුදලක් හෝ භාණ්ඩයක්, තනතුරක් හෝ වෙනත් වරප්‍රසාදයක් දෙන්නේ නම් එය අල්ලසකි.**

ජනතා නිදහස් පෙරමුණේ ලේකම් ඇතුළු මන්ත්‍රීවරුන්ගෙන් බහුතරය සියළු ශක්තිය යොදා උත්සාහ කළේ සදාචාර සම්පන්න දේශපාලනයක් වෙනුවෙන් වූ ජනාධිපති මෛත්‍රීගේ ප්‍රතිපත්තිවලට සහයෝගය දෙන්නට නොව අපරාධවලින් ගහන වූ මහින්ද රාජපක්ෂගේ පාලන කාලයේ සිදුවූ බරපතල වැරදි වසන් කිරීමටය. ඒ සඳහා ඔවුන් පාර්ලිමේන්තුව යොදා ගත් අයුරු ඉතා හොඳින් රටට ප්‍රදර්ශනය විය. 19වැනි ව්‍යවස්ථා සංශෝධනය හැකි තරම් කප්පාදු කරන්නට ඔවුන් පාර්ලිමේන්තුවේ බහුතර බලය යොදා ගත් අතර අවසානයේදී එය අනුමත කරන්නට ඡන්දය දුන්නේ එසේ නොකළේ නම් තම දේශපාලන ජීවිතය එයින්ම කෙළවර වන බව පෙනුනු නිසා මිස මෛත්‍රීගේ ප්‍රතිපත්තිවලට එකඟ වන නිසා නොවන බව එයින් පසුව ඔවුන්ගේ හැසිරීමෙන් වටහා ගත හැකිය. ඔවුන් කොතරම් වලිකෑවත් මහින්දගේ අවිචාර සමය පිළිබඳ මතකය බහුතර ජනයාගේ මතකයෙන් ඉවත් කළ හැකි වේද?

## තම සදාචාරය මහින්දගේ කටින්ම

අප්‍රේල් 21 වැනි දින හේනේගම විහාරස්ථානයකදී හිටපු ජනාධිපතිවරයා තමාගේ දේශපාලන සදාචාරය ගැන ප්‍රසිද්ධියේ කළ ප්‍රකාශය රටට අමතක වෙන්නට තරම් කාලයක් ගතවී නැත. '' මගේ වැරදි තිබුණා. සමහර වැරදි කරපු අය අපි බලපෑම් කරල නිදහස් කළා. සමහර අය කරපු වැරදිවලට අපි දඩුවම් කළේ නෑ. අපි ඒව වසන් කරන්න හැදුව. මම කරපු වැරදි මේව. අද මම ඒක පිළිගන්නව. සමහරු පොලීසියෙ අතටම අහුඋනා.''

මෙසේ කියන ඔහු, ඒ කාලයේ සිදුකළ වංචා දූෂණ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් මැති ඇමතීන් බලන්නට බන්ධනාගාරයටත් රෝහල්වලටත් යමින්, කීවේ කුමක්ද? තමාගේ අමාත්‍යාංශය යටතේ පැවති සතොස ආයතනයෙන් මිලියන ගණනක බඩු ගෙන ණය නොගෙවා සිටීමේ චෝදනාවට අත්අඩංගුවට ගත් ජොන්ස්ටන් ප්‍රනාන්දු බලන්නට ගිය ඔහු කීවේ 'ඕන කෙනෙකුට ණය ගන්න පුළුවන්. ඒක අපරාධයක් වෙන්නෙ කොහොමද?' යනුවෙනි. මහින්දගේ දේශපාලන සදාචාරයට අනුව ජොන්ස්ටන් වරදක් කර නැත.

ජනාධිපතිවරණ දිනයට දිනදෙකතුනක් තිබියදී තම අමාත්‍යාංශය යටතේ පැවති දිවිනැගුමේ ගිණුම්වලින් කෝටිගණනක් ඉවත්කර ගැනීමේ චෝදනාවට තම සොහොයුරු බැසිල් රාජපක්ෂ අත් අඩංගුවට ගත් විට හිටපු ජනාධිපතිවරයා කීවේ බැසිල් වරදක් කර නැති බවයි. ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත්කර වීඅයිපී ගමන් බලපත්‍රයක් ලබාගැනීමේ චෝදනාවට හිටපු අමාත්‍ය විමල් වීරවංශගේ බිරිඳ අත්අඩංගුවට ගත් විට මහින්ද රාජපක්ෂ කීවේ මේ ආණ්ඩුව දරුපවුල්වලින් පවා පළිගන්නා බවයි. මේ අයුරින් පසුගිය දිනවල විවිධ දූෂණ චෝදනා යටතේ අත් අඩංගුවට ගත් කිසිවකු මහින්ද රාජපක්ෂගේ දේශපාලන සදාචාරයට අනුව වරදක් කර නැත. අත් අඩංගුවට ගත්, සහ ප්‍රශ්නකිරීම්වලට භාජනය වූ කිසිවකු වැරදි කර නැත්නම් ඔහු හේනේගම පන්සලේදී කළ ප්‍රකාශයට අනුව තම පාලන කාලයේ බලපෑම් කර ආරක්ෂා කර ගත් මැති ඇමතිවරු කවුද යන ප්‍රශ්නය ජනයා ඉදිරියේ මතු වෙයි.

## පුද්ගලික උදව්

මෑතකදී රූපවාහිනී සාකච්ඡාවකදී මහින්ද කාලයේ හිටපු ජනමාධ්‍ය අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල කළ ප්‍රකාශයක් මෙහිදී වැදගත් වෙයි. තමාට මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා පුද්ගලිකව විශාල වශයෙන් උදව් කර ඇති බැවින් ඔහුට විරුද්ධ වෙන්නට බැරි බව කෙහෙලිය කීවේය. ඒවා අමතක කරන්නට බැරි බරපතල උදව් බව අපි දනිමු. මිලියන ගණනින් ගිණිය යුතු ඒ උදව් කර ඇත්තේ මහජන මුදලින් බවත් දැන් මහින්ද රාජපක්ෂගේ කටින්ම කියැවෙන පරිදි සමහරුන්ට උදව් කර ඇත්තේ නීතිය ක්‍රියාත්මක කෙරෙන ආයතවලටද බලපෑම්කරමින් බවත් රහසක් නොවේ. **ජනාධිපතිවරණය කාලයේ රාජ්‍ය ආයතනයක වියදමින් කෝටි හැටක සිල්රෙදි බෙදීම සම්බන්ධයෙන් අද ඔහු කියන දේ ඔහු රටට හුරුකළ දේශපාලන සදාචාරය කවරේද යන්න පෙන්වන තවත් නිදසුනකි. 'සිල්ගන්න අයට සිල්රෙද්දක් දෙන්නත් බැරිනම් ඒක පුදුම වැඩක් නේ' යයි ඔහු කියයි.** ඡන්දයක් ප්‍රකාශයට පත් කළ පසු කිසියම් අපේක්ෂකයකු මහජන මුදලින් පමණක් නොව තම පුද්ගලික ධනයෙන් වුවද ඡන්ද දායකයකුට යම් මුදලක් හෝ භාණ්ඩයක්, තනතුරක් හෝ වෙනත් වරප්‍රසාදයක් දෙන්නේ නම් එය අල්ලසකි. ඒ අනුව තිස්ස අත්තනායකට ඇමතිකමක් දීමේ සිට සිල් රෙදි, කැලැන්ඩර්, ඔරලෝසු බෙදීම දක්වා වූ සියල්ල මැතිවරණ නීතිය යටතේ අල්ලස් ලෙස සැලකේ. අවුරුදු දහයකට ආසන්න කාලයක් රටේ ජනාධිපතිකම් කළ පුද්ගලයා මෙය නොදන්නේද? නොදන්නවා නොව ඔහු රටට හුරු කළ දේශපාලන සදාචාරය තුළ ඒ කිසිඳු නීතියක් ඔහුටත් ඔහුගේ ගෝලබාලයන්ටත් වලංගු නැති බවය ඔහු කියන්නේ.

වත්මන් රජයේ ඇමතිකම් බාරගෙන සිට මෑතක ඒවායින් ඉවත්වූ මහින්ද ආණ්ඩුවේ ඇමතිකම් කළ හතර දෙනෙක් පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවේදී මහින්ද යාපා කිවේ රනිල්ගේ ආණ්ඩුවේ ඇමතිවරු තමන්ට වැඩ කරන්නට ඉඩ නොදෙන නිසා ඉවත් වන බවත් මෙය තම පක්ෂයේ පාක්ෂිකයන් වෙනුවෙන් ගත් තීන්දුවක් බවත්ය. එයින් කියැවෙන්නේ ඇමතිවරු වැඩකළයුත්තේ පොදුවේ රටට නොව තම පක්ෂයේ පාක්ෂිකයන්ට බවයි. මෙය මහින්දගේ ආණ්ඩුවේ පමණක් නොව මෙතෙක් දශක කීපයක් තිස්සේ පැවති සෑම ආණ්ඩුවක්ම අනුගමනය කළ ප්‍රජාතන්ත්‍ර විරෝධී දේශපාලන සදාචාරයේ ස්වරූපය පෙන්වන්නකි. ජනාධිපතිවරයා සේ ම ඇමතිවරුද ඒ තනතුරුවලට පත්වූ පසු වැඩ කළ යුත්තේ පොදුවේ රටට මිස එක් පක්ෂයක පාක්ෂිකයන්ට, අනුගාමිකයන්ට පමණක් නොවේ.

## කටවුට් දේශපාලනය

මේ කාරණයේදී වත්මන් ආණ්ඩුවේ එක්සත් ජාතික පක්ෂ ඇමතිවරුන් සේ ම සමහර ආසන සංවිධායකවරුන් සම්බන්ධයෙන්ද අපේ විවේචන වලංගු බව අවධාරණය කළ යුතුව තිබේ. ඇමතිකම් දරණ සමහරු දැන්මම අප්‍රසන්න කටවුට් දේශපාලනය ප්‍රදර්ශනය කරමින් සිටින අතර ඡන්ද දායකයන්ට බෙදීම සඳහා භාණ්ඩ රැස්කරමින් සිටින බවද වාර්තා වෙයි. ඉදිරි මැතිවරණයේදී මනාප ක්‍රමය තිබුණත් නැතත් දැවැන්ත කටවුට් සහ පෝසටර් ප්‍රදර්ශන දේශපාලනය පිටුදැකීම අවශ්‍යය. එය ප්‍රධාන පක්ෂ දෙකේ නායකයින්ට බාර වගකීමකි. තම පක්ෂයෙන් නාමයෝජනා ලබන කිසිවකු කටවුට් පෝස්ටර් ප්‍රදර්ශනය නොකළ යුතුය යන නියෝගය පක්ෂ නායකයින් විසින් නාම යෝජනා දෙන අවස්ථාවේම දෙන්නේ නම් පාරවල්, බිත්ති සුද්ධ කිරීමට පොලීසියට කෝටි ගණන් මහජන මුදල් ලබා දීමටත් පොලිස් නිලධාරීන් කසල ශෝධක සේවයේ යොදවමින් ඔවුන්ගේ වෘත්තීය ගෞරවය කෙළෙසන්නටත් සිදුවන්නේ නැත. එසේම ඡන්ද අල්ලස් සම්බන්ධයෙන් පැමිණිලි ලැබුණු වහාම ඒ සම්බන්ධයෙන් පියවර ගැනීම මැතිවරණ කොමසාරිස්වරයාගේ වගකීම බව අවධාරණය කරමු.

වත්මන් ජනාධිපතිවරයා මේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක් බවට පත් කරන්නට අධිෂ්ඨානයෙන් කටයුතු කරන නායකයකු බව මේ කෙටිකාලය තුළ ඔප්පු කර තිබේ. ඔහු යහපත් දේශපාලන සංස්කෘතියක් ගොඩනගන්නට ඇප කැපවන බව කියයි. එ සේ නම් එතුමා එහි ආදර්ශ රූපය විය යුතු වෙයි. මහා මැතිවරණයේදී එතුමා නිර්පාක්ෂික විය යුතු යයි අප කියන්නේ ඒ නිසාය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා ලෙස එතුමා කළ යුතු වන්නේ මහජන අප්‍රසාදයට ලක්වී සිටින කිසිවකුට නාමයෝජනා නොලැබෙන්නට වග බලා ගැනීමයි. තවමත් පක්ෂයේ කිසිම මන්ත්‍රීවරයකු චෝදනාවලට වරදකරුවන්යයි උසාවියකින් ඔප්පු වී නැති නිසා දැනට සිටින සියලු දෙනා නාමයෝජනා ලැබීමට සුදුස්සන් වන්නේ යයි පක්ෂයේ මහ ලේකම් අනුර ප්‍රියදර්ශන යාපා කියන කතාව ජනාධිපතිතුමා අනුමත කරන්නේද යන්න දැන ගන්නට අපි බලා සිටින්නෙමු. අනුරයාපා 'සුදුසසන්' යයි කියන අය අතර මිනීමැරුම් සම්බන්ධයෙන් චෝදනා ලැබූවන්ද කුඩු ගෙන්වන්නන් ලෙස ප්‍රසිද්ධ වූවන්ද එතනෝල්කාරයන්ද සිටින බවත් වසර පහ හයක් ඇතුළත කෝටි ප්‍රකෝටි ගණන් ධනය උපයා ගත්තවුන්ද සිටින බවත් මෙරට නීතිය පසඳින්නන් කෙසේ වෙතත් ඡන්දදායකයෝ නම් දනිති. ඒ අතරම ශ්‍රී ලංකාවේ අපරාධ සම්බන්ධයෙන් නඩු පැවරෙන අයගෙන් දඬුවම් ලබන්නේ 5 % කටත් අඩු ප්‍රමාණයක් යයි පිළිගැනීමක් ඇති බව ද සිහිපත් කරමු.

